www.kidworship.kr

# රොටී පහයි, මාලු දෙකයි

-Five Loaves & Two Fish-




42Page

| | |
|---|---|
| පොතේ ගුරා | එක දවසක්දා යේසුස්වහන්සේ ගලීලයේ මුහුදු වෙරළේ දේශනා කරමින් සිටියා. උන්වහන්සේ විසින් කරන ලද හාස්කම් ඇසූදුටු අය බොහෝ පිරිසක් උන්වහන්සේ පසුපස ආවා. යේසුස්වහන්සේද සෙනග අතරේ ඇවිදිමින්, රෝගීන් සුව කරමින් දේවරාජ්‍යය දේශනා කළා. හවස්වීගෙන එත්ම ගෝලයන් යේසුස්වහන්සේ ළගට ඇවිත් මෙසේ ප්‍රශ්ණ කළා. |
| පළමු ගෝලයා | මේ තරම් ජනකායක් සමග අපි මොනවද දැන් කරන්නේ ? |
| දෙවන ගෝලයා | මෙක් පාලු ස්ථානයක්, දැනටම කළුවර වීගෙන ඇවිත්, ඔවුන්ට කෑම සපයා ගන්න පිණිස මේ සෙනග අපි නගරයට පිටත් කරන්නේ නැත්තේ ඇයි ? |
| පොතේ ගුරා | එවිට යේසුස්වහන්සේ කතාකොට, |
| යේසුස්වහන්සේ | ඔවුන් එතරම් දුරක් යාම අවශ්‍ය වෙන්නේ නෑ. ඔයාලා කෑමට මොනවහරි දෙන්න. |
| ගෝලයා | යේසුනි, අපි ළග මුදල් නෑ; අපි ළග මුදල් තිබුණත් මේතරම් ජනතාවකට කෑම කන්න දෙන්නේ කොහෙන්ද? කෑම ගන්න තැනැක් මේ ළග කොහේ-වත් නෑ. එහෙමනම් මේ තරම් ජනකායකට අපි කෑම කන්න දෙන්නේ කොහොමද? |
| යේසුස්වහන්සේ | එහෙමනම්, කවුරුන් ළග හෝ කෑමට යමක් තිබෙනවාද කියා ඔබලා සෙනග අතරට ගොස් සොයා බලන්න. |



43Page

| | |
|---|---|
| පොතේ ගුරා | ගෝලයන් ටිකවෙලාවක් සොයා බලා නැවතත් යේසුස්වහන්සේ වෙතට හැරී ඇවිත් මෙසේ කීවා: |
| දෙවන ගෝලයා | පිරිමි ළමයෙක් නම් ඉන්නවා. එයා ළග කුඩා රොටී 5ක් සහ පුංචි මාලු දෙකක් තියෙනවා. |
| යේසුස්වහන්සේ | ඒ කෑම එක මෙතැනට ගේන්න. |
| පොතේ ගුරා | ගෝලයන් පිරිමි ළමයාගෙන් මෙසේ ඇසුවා ? |
| ගෝලයා | ඔයා ළග තියෙන කෑම එක යේසුස්වහන්සේට දෙන්න පුලුවන්ද? |
| ළමයා | අනිවාර්‍යයෙන්ම, ආ... මෙන්න |
| පොතේ ගුරා | මේ ළමයා ඔහු ළග තිබුණු රොටී පහ සහ මාලුවන් දෙක යේසුස්වහන්-ස්ගේ ගෝලයන්ට දුන්නා. |



44Page

| | |
|---|---|
| පොතේ ගුරා | ගෝලයන් යේසුස්වහන්සේ වෙතට මේ කෑම ගෙනැවිත් දුන්නා. එවිට, ජනතාව 50 කණ්ඩායම් බැගින් හිඳුවන්නැයි කියා යේසුස්වහන්සේ කීවා. එහි 5000ක් පමණ |
| මනුෂ්‍යයන් සිටියා | හැබැයි, ඒත් පිරිමි අය පමණක් ගණන් කළවිට පමණි. යේසුස්වහන්සේ රොටී පහයි මාලු දෙකයි රැගෙන ස්තුති පුදා ඔවුන්ට දී මෙසේ කීවා: |

**යේසුස්වහන්සේ** මේක මේ ජනතාවට බෙදන්න.

**පොතේ ගුරා** ඊළඟට සිදු වූයේ කුමක්ද? අරුම පුදුම දෙයක් ! මේ සෙනගට බෙදාගෙන යද්දී කොපමණ බෙදුවත් රොටී සහ මාලු ඉවර වුණේ නෑ.

................................................................................................................



45Page

**පොතේ ගුරා** පන්දහසක් ජනතාවෝ උණුසුම් අන්දමින් ඇතිවෙන්නම කෑමවේල භුක්ති වින්දා. ඔවුන් යේසුස්වහන්සේගේ බලය ගැන විශ්මපත් වුණා. යේසුස්-වහන්සේ ගෝලයන්ට කතාකොට:

**යේසුස්වහන්සේ** ඉතිරි වී ඇති කෑබලි ඔක්කොම එකතු කරන්න. කිසිදෙයක් නාස්ති කරන්න එපා.

**ගෝලයා** කරුණාකරලා, හැමෝම ඉතිරිවෙලා ඇති කෑබලි මේ මෙතැනින් තියන්න...

................................................................................................................



46Page

**පොතේ ගුරා** ඔවුන් විසින් ඉතිරි කෑබලි සියල්ලම එකතු කළ විට කූඩ 12ක් පිරෙන්නම කෑම තිබුණා. ගෝලයන්ගේ සහ ජනතාවගේ ඇදහිල්ලත්, යේසුස්-වහන්සේ කෙරෙහි වූ ගෞරවයත් බොහෝ සෙයින් වැඩිවුණා පමණක් නොව ඔවුන් තවදුරටත් අඛණ්ඩව උන්වහන්සේ අනුව ගියා.

**ජීවිතයට අදාල කිරීම** දුවේ පුතේ, යේසුස්වහන්සේ මිනිසුන්ගේ අවශ්‍යතාවයන් ගැන හරිම සැළකිලිමත් නේද? ඔව්! භය වෙන්න එපා අද ඔයාට අවශ්‍ය දේ උන්-වහන්සේට කියන්න. විශ්වාසයෙන් යාච්ඤා කරන්න. උන්වහන්සේට අදත් හාස්කම් කරන්න පුලුවන්.